**<u>ජාතික ඉතිරි කිරීමේ බැංකුව.</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS)

**(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16**

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් රු. 361,158,839 ක් පිරිවැය වූ විෂයයන් පන්සිය හතලිහක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් තවදුරටත් අඛණ්ඩව භාවිතා කර තිබුණි. ඒවා ප්‍රත්‍යාගණනය කර නියමිත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2009 වර්ෂයේදී නාවික හමුදාව විසින් අත් කර ගන්නා ලද උස්වැටකෙයියාව ඉඩමේ රු.6,995,174 ක් වූ වටිනාකම 2012 දෙසැම්බර් 31 වන විටත් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

### 1.2.3 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

---------------------------------------

පහත සඳහන් පැහැදිලි නොකරන ලද වෙනස්කම් නිරීක්ෂණය විය.

(අ) 2012 මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය පිළිවෙලින් රු. 240,254,639 ක් හා රු. 59,942,007 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගලපන ලද දළ වැටුප් පදනම් කරගත් ගණනය කිරීම් අනුව එය පිළිවෙලින් රු. 240,079,027 ක් හා රු. 60,019,757 ක් විය. එබැවින් හඳුනාගත් වෙනස්කම් පිළිවෙලින් රු. 175,612 ක් හා රු. 77,749 ක් විය.

(ආ) භාර සහතිකවල ආයෝජන යටතේ මූල්‍ය සමාගමක ආයෝජනයන් ලෙස රු.184,420,746 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද, බැංකුව විසින් ඉදිරිපත් කරන ලද ශේෂ සනාථ කිරීම් හා උපලේඛන අනුව ආයෝජන වටිනාකම රු. 185,701,000 ක් වූයෙන් රු. 1,280,253 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්‍රීය ගිණුම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු. 260,044,858 ක් වර්ෂ පහකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති රු. 13,963,717 ක් වූ වංචනික ආපසු ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර, එම ශේෂයෙන් රු. 13,188,717 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඇ) රු.1,682,084 ක් හා රු. 1,924,524 ක්වූ ගනුදෙනු කරුවන්ට ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු පිළිවෙලින් වර්ෂ පහකට හා වර්ෂ තුනකට වැඩි කාලයක් පරිශේෂව පැවතුණි.

(ඈ) වර්ෂ පහකට වැඩි කාලයක් ඉක්ම වූ රු. 2,699,061 ක ශේෂයක් තැන්පතු නිෂ්කාෂණ ගිණුමේ දක්වා තිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| මූල්‍ය ප්‍රකාශනවල විෂයයන් | මුදල | ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| විවිධ ණය හිමියන් | 28,028,481 | කාල විශ්ලේෂණ |
| ණය හිමි පාලන ගිණුම | 26,006,153 | කාල විශ්ලේෂණ |
| රැස් කිරීම සඳහා යවන ලද බිල්පත් | 248,728,135 | |
| සැපයුම් කරුවන්ට අත්තිකාරම් | 8,062,774 | සනාථ කිරීම් |

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 අංක 10 දරන පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත. | (i) ගිණුම් විවෘත කිරීමේදී ඉල්ලුම්පත්‍රය සමඟ බදු ප්‍රකාශන, ශාඛා 15 ක් විසින් අවස්ථා 202 කදී ගනුදෙනුකරුවන්ගෙන් ලබාගෙන නොතිබුණි. |
| | (ii) ශාඛා 15 කට අදාළව ගනුදෙනුකරුවන් 63 ක් විසින් ඔවුන්ගේ තක්සේරුගත ආදායම රු.500,000 නොඉක්මවන බවට බදු ප්‍රකාශන ලබාදී තිබුණද රු.756,312,255 ක්වූ තැන්පතු ඉහත සීමාවන් ඉක්මවා තිබුණි. |

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 06 මගින් සංශෝධිත 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය.

| | |
|---|---|
| (i) 2.14.1 ඡේදය | (i) පහත දැක්වෙන ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ජාතික තරඟකාරී ලංසු පරිපාටිය අනුගමනය කර නොතිබුණි.<br>❖ රු.4,895,520 කට අඛණ්ඩ බල සැපයුම් (UPS) 10 ක් මිලදී ගැනීම.<br>❖ “හපන් තැගි අයිතම” රු.96,000,000 කට මිලදී ගැනීම. |
| (ii) 3.3. ඡේදය | (i) බැංකුව විසින් ලියාපදිංචි සැපයුම් කරුවන් ගෙන් ලංසු කැඳවීම සෘජුවම කළ යුතුය. කෙසේ වුවද, රු.8,484,000 කට “Informix user Licenses” 75 ක් මිලදී ගැනීමේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් ලංසු කැඳවා නොතිබුණි. |
| | (ii) කුඩා ප්‍රමාණයක සැපයුම්කරුවන් සිටින අවස්ථාවකදී තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කරන එවැනි භව්‍ය සැපයුම්කරුවන්ගෙන්ද ලංසු කැඳවිය යුතුය. කෙසේ වුවද “Informix user Licenses” සපයන IBM සමාගමේ අනිකුත් ව්‍යාපාර හවුල් කරුවන්ගෙන් ඉතිරි කිරීමේ බැංකුව විසින් ලංසු කැඳවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (iii) 4.2.1 ඡේදය | 2012 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |
| | (iv) 8.9.3 ඡේදය | වටිනාකම රු.500,000 වැඩි කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කළ යුතුය. කෙසේ වුවද, පහත සඳහන් ප්‍රසම්පාදන සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.<br>(අ) රු.64,117,500 කට "බ්ලෙන්ඩර්ස්" 57,100 ක් හා "සෝස් පැන්ස් " 30,000 ක් ප්‍රසම්පාදනය<br>(ආ) රු.4,895,520 කට අඛණ්ඩ බල සැපයුම් (UPS) 10 ක් මිලදී ගැනීම.<br>(ඇ) රු.11,891,196 කට බිම් "ස්විච්ස්" 40 ක් මිලදී ගැනීම.<br>(ඈ) රු.7,866,000 කට 2012 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාවේ සේවා කොන්ත්‍රාත්තුව<br>(ඉ) රු.27,065,000 කට "ඩිජිටල් මීඩියා සිස්ටම්" 80 ක් මිලදී ගැනීම.<br>(ඊ) රු.8,484,000 කට "Informix user Licenses" 75 ක් මිලදී ගැනීම. |
| (ඇ) | 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හා 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/06 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | අදාළ විධිවිධාන වලට පටහැනිව බැංකුව විසින් එහි අරමුදල්වලින් සේවකයන් වෙනුවෙන් රු.50,963,789 ක්වූ උපයනවිට ගෙවීම් බදු 2012 වර්ෂය සඳහා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍යාධිකාරිගේ අංක 425/97 දරන චක්‍රලේඛය. | ණය මුදල් නිරවුල් කරන තුරු ස්ථාවර තැන්පතු මුදා නොහැරිය යුතු වුවද, ශාඛා 4 කට අදාළව රු.766,353 ක්වූ අදාළ ණය නිරවුල් කිරීමෙන් තොරව ස්ථාවර තැන්පතු ගිණුම් අටක් මුදාහැර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-----------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය
--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 6,169 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය රු. මිලියන 9,255 ක් වූයෙන් රු. මිලියන 3,086 කින් හෙවත් සියයට 33.34 කින් මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමක් දැක්වුණි.
සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ පරිපාලිතයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 52 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදුපෙර ශුද්ධ ලාභය රු.මිලියන 156 ක් වූයෙන් රු. මිලියන 104 කින් මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමක් දැක්වුණි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ රු. මිලියන 6,169 ක් වූ බදු පෙර ශුද්ධ ලාභය, ප්‍රධාන කාර්යාලයේ රු. මිලියන 3,651 ක්වූ පාඩුවෙන්, එකතුව රු. මිලියන 10,075 ක් වූ ශාඛා 166 ක (බැංකු ශාඛා, තැපැල් ශාඛා, පියස ඒකක හා අංශ) ලාභයෙන් සහ එකතුව රු. මිලියන 255 ක් වූ බැංකු ශාඛා 55 ක හා අංශ 02 ක පාඩුවලින් සමන්විත වේ.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සමස්ත ආදායම රු. මිලියන 53,045 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ රු. මිලියන 46,545 සමඟ සැසඳීමේදී රු. මිලියන 6,500 කින් හෙවත් සියයට 14 කින් වැඩිවීමක් විය. පොලී අනුපාත වැඩි වීම එයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 වැදගත් අනුපාත හා ප්‍රතිශත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ බැංකුවේ වැදගත් අනුපාත පහත දැක්වේ.

| | **2012** | **2011** |
|---|---|---|
| (අ) ලාභදායිත්ව මට්ටම | | |
| (i) සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) % | 18.28 | 26.61 |
| (ii) සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) % | 1.26 | 2.13 |
| (ආ) <u>ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය</u> | | |
| හිමිකම්: මුළු වත්කම් | 1:20.94 | 1:20.21 |
| (ඇ) <u>ද්‍රවශීල වත්කම්</u> | | |
| ද්‍රවශීලතා අනුපාතය (%) | 69.5 | 74.4 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ හිමිකම් මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ හා ද්‍රවශීලතා අනුපාතය පිළිවෙලින් සියයට 31 කින්, සියයට 41 කින් හා සියයට 7 කින් අඩුවී තිබුණි.

## 2.3 ණය පරිපාලනය

2012 හා 2011 වර්ෂ සඳහා ලබා දුන් ණය සහ බැංකුවේ අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2012 | | | | 2011 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ලබාදුන් ණය | | 2012 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය | | ලබාදුන් ණය | | 2012 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය | |
| | ණය සංඛ්‍යාව | මුදල | ණය සංඛ්‍යාව | මුදල | ණය සංඛ්‍යාව | මුදල | ණය සංඛ්‍යාව | මුදල |
| | | රු. මිලියන | | රු. මිලියන | | රු. මිලියන | | රු. මිලියන |
| අලංකාර ණය | 11 | 8.80 | 07 | 6.32 | 21 | 21.67 | 06 | 3.45 |
| වාහන ණය | 53 | 143.54 | 02 | 2.47 | 43 | 58.77 | - | - |
| වාණිජ ණය | 02 | 1,225.95 | - | - | - | - | - | - |
| විදේශ ණය | 52 | 141.15 | 43 | 85.58 | 70 | 174.14 | 31 | 55.22 |
| රජය - නිවාස හා දේපල ණය | 5,563 | 4,261.45 | 664 | 395.33 | 3,890 | 2,929.71 | 690 | 422.92 |
| නිවාස හා දේපල | 3,212 | 3,957.57 | 3,643 | 1,904.99 | 2,160 | 2,629.48 | 3,729 | 2,092.83 |
| නිවාස හා දේපල ණය මිහිඳු | - | - | 07 | 7.16 | - | - | 10 | 9.32 |
| ජා.නි.සං. ජන සෙවන | - | 891.54 | - | - | - | - | - | - |
| ඇප මත පෞද්ගලික ණය | 153 | 116.11 | 16 | 10.69 | 19 | 13.73 | - | - |
| පෞද්ගලික ණය | 10,591 | 2,410.14 | 1,223 | 108.39 | 5,819 | 1,215.35 | 1,160 | 60.89 |
| ව්‍යාපෘති ණය | 01 | 1,373.13 | - | - | 02 | 1,263.90 | - | - |
| සේවක ණය | 352 | 351.67 | - | - | 522 | 532.86 | - | - |
| විශ්ව විද්‍යාල සේවක ණය | 15 | 16.23 | 01 | 1.00 | - | - | - | - |
| රට ඉතුරු ණය | - | - | 482 | 18.70 | - | - | - | - |
| එකතුව | 20,005 | 14,897.28 | 6,088 | 2,540.63 | 12,546 | 8,839.61 | 5,626 | 2,644.63 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂය තුළදී ලබාදුන් ණය සංඛ්‍යාව හා එහි වටිනාකම පිළිවෙලින් සියයට 59 කින් හා සියයට 69 කින් වැඩි වී තිබුණි. වැඩි වී තිබූ මුළු ණය සංඛ්‍යාවෙන් සියයට 64 ක්, සියයට 14 ක්, හා සියයට 22 ක් පිළිවෙලින් පෞද්ගලික ණය, නිවාස හා දේපල ණය සහ රජයේ නිවාස හා දේපල ණයවලින් නියෝජනය විය.

(ii) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ඇප මත පෞද්ගලික ණය සියයට 700 කින් සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි.

(iii) 2011 වර්ෂය සමඟ සැසඳීමේදී 2012 වර්ෂය තුළ පෞද්ගලික ණය සහ ඇප මත පෞද්ගලික ණයවල අක්‍රීය ණය ගිණුම් සංඛ්‍යාව වැඩි වී තිබුණි. කෙසේ වුවද, නිවාස හා දේපල අක්‍රීය ණය සියයට 2 කින් අඩුවී තිබුණි.

**2.3.2 විශ්‍රාමික මාණ්ඩලික නිලධාරීන්ගේ ණය**

**--------------------------------------**

නිලධාරීන් විශ්‍රාම යන අවස්ථාවේදී අයවිය යුතුව තිබූ වටිනාකම රු. 13,364,811 ක් වූ ණය 2012 දෙසැම්බර් 31 දිනට අය නොවී පැවතුණි.

**2.3.3 වැඩ තහනම් කළ සහ සේවය අත්හැර ගිය නිලධාරීන්ගේ ණය**

**------------------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ, සේවය අත්හැර ගිය, සේවයෙන් ඉවත්වූ, සේවයෙන් පහ කරන ලද හා සේවය අවසන් කරන ලද නිලධාරීන් 40 ක ගෙන් අයවිය යුතු රු.9,140,994 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.4,026,833,817 ක්වූ සේවක ණයවල ඇතුළත් කර තිබුණි.

**2.3.4 වී මිල ස්ථායිකරණය සඳහා වී අලෙවි මණ්ඩලයට ලබා දුන් ණය**

**-------------------------------------------------------------**

2012 වර්ෂයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහන සඳහා රු. 1,225,946,271 ක මුදලක් සියයට 12 ක වාර්ෂික පොලි අනුපාතයකට වී අලෙවි මණ්ඩලයට ලබා දී තිබුණි. අවබෝධතා ගිවිසුම අනුව, 2013පෙබරවාරි 28 දිනට පෙර පොලිය සම්පූර්ණයෙන්ම නිරවුල් කළ යුතු විය.

එසේ වුවද, එදිනට හිඟ හිටි ණය ශේෂය හා ගෙවිය යුතු පොලිය පිළිවෙලින් රු. 615,306,010 ක් හා රු. 39,272,067 ක් විය. තවද 2012 දෙසැම්බර් 31 දිනට ණය මුදල හා අයකර ගත යුතු පොලිය පිළිවෙලින් රු. 725,945,270 ක් හා රු. 26,782,201 ක් විය.

**2.3.5 නිවාස යෝජනා ක්‍රමයක් ඉදි කිරීම සඳහා ව්‍යාපෘති ණය ලබා දීම**

1996 වර්ෂය තුළදී පෞද්ගලික සමාගමකට සියයට 20 ක පොලී අනුපාතයකට රු. මිලියන 50 ක හා රු. මිලියන 30 ක ණය මුදල් දෙකක් ලබා දී තිබුණි. මෙම ණය 1999 ජුලි වන විට සම්පූර්ණයෙන්ම නිරවුල් කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කිසිදු වාරිකයක් ගෙවීමෙන් තොරව සම්පූර්ණ ණය මුදලම හිඟ ලෙස පැවතුණි.

(ii) 2004 නොවැම්බර් 06 දිනට ඉහත ණය සම්බන්ධයෙන් බැංකුවට ගෙවන ලද පොලී මුදල් පිළිවෙලින් රු.8,524,520 ක් හා රු. 1,546,028 ක් විය.

(iii) 2006 මාර්තු 10 දිනැති මාණ්ඩලික පත්‍රිකාව අනුව, අත්කරගත් දේපලවල ප්‍රමාණය අක්කර 6, රූඩ් 3 පර්චස් 21.75 ක් විය. කෙසේ වුවද, අදාළ තක්සේරු වාර්තා සහ මැනුම් සැලසුම් අනුව, දේපලවල ප්‍රමාණය අක්කර 6 රූඩ් 2 පර්චස් 12.8 ක් වූ බැවින් රූඩ් 1 පර්චස් 8.95 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iv) ඉහත ණය අයකර නොගැනීම හේතුවෙන් බැංකුවට පොලී ආදායම අහිමි වීමෙන් වූ පාඩුව 2004 දෙසැම්බර් 31 දිනට රු.185,400,000 ක් විය.

(v) රු. මිලියන 184 ක් වටිනාකම වූ ඉහත දේපලවල කොටසක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්කරගෙන තිබූ අතර, එයින් රු. මිලියන 113 ක් බැංකුවට අයත් වූ ඉඩමට අදාළව විය. කෙසේ වුවද බැංකුව ලබාගත් වටිනාකම රු. මිලියන 70.3 ක් පමණක් විය. තක්සේරුකරුගේ මුදල සමඟ සැසඳීමේදී රු. මිලියන 42.7 ක මුදලක් ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(vi) ලබාදුන් රු. මිලියන 80 ක ණය නිරවුල් කිරීම සඳහා හිඟ පොලිය සැලකිල්ලට ගැනීමෙන් තොරව රු. මිලියන 70.3 ක මුදලක් පමණක් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් රු. මිලියන 9.7 ක පාඩුවක් බැංකුවට සිදුවී තිබුණි.

(vii) ඉහත ඉඩම් වලින් රු. මිලියන 13.3 ක් වටිනා ඉඩම් කැබලි 3 ක් රජය විසින් 2008 ජුනි 2 දිනැති අංක 1604/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අත්කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු මුදලක් රජය විසින් මේ වනතුරු ගෙවා නොතිබුණි.

**2.3.6 උකස් අත්තිකාරම්**

බැංකුවේ ශාඛා 15 ක් විසින් උකස් අත්තිකාරම් ගෙවීම්වලට අනුව, රත්රන් භාණ්ඩ සම්බන්ධයෙන් අවස්ථා 55 කදී රු. 21,319,372 ක් වූ ගෙවීම් සිදු කර තිබුණි. මෙහිදී රත්රන් පිළිබඳ අනුපාතය ඉතා වැඩියෙන් දක්වා තිබුණු නමුත්, පසුව භෞතික පරීක්ෂණයේදී රන් අනුපාතය 10 සිට 18 අතර හෝ ඊට අඩු බව නිරික්ෂණය විය.

**2.3.7 අයකරගත නොහැකි නිවාස ණය හිලව් කිරීම සඳහා අත්කරගත් දේපල**

ණය ගිණුම් 11 ක් යටතේ පුද්ගලයින් 09 දෙනෙකුට ලබාදුන් රු. 15,403,677 ක් වූ ණය වල ශේෂයන් අයකර ගැනීමට නොහැකි වීමෙන් එම ණය වලට අදාළ දේපල බැංකුව විසින් අත්කරගෙන තිබුණි. මෙම දේපල වෙන්දේසි කර ණය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. දේපල අත්කරගත් ණය ගිණුම් 03 කට අදාළ ණය රු. 2,053,277 ක් විය. උපලබ්ධි වූ වලංගු විකුණුම් වටිනාකම රු. 1,400,000 ක් වූ අතර, උපලබ්ධි වූ වලංගු විකුණුම් වටිනාකම ඉක්මවන ලද ණය ප්‍රමාණය රු. 653,277 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ශාඛා කාර්ය සාධනය**

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ශාඛාවල කාර්ය සාධනය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 | 2011 |
|---|---|---|
| ශාඛා සංඛ්‍යාව | 219 | 210 |
| තැපැල් ශාඛා සංඛ්‍යාව | 12 | - |
| තැපැල් කාර්යාල සංඛ්‍යාව | 4053 | 4058 |
| ගිණුම් හිමියන් සංඛ්‍යාව (මිලියන) | 17.4 | 17.0 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 231 | 221 |
| පාසැල් බැංකු ඒකක | 1185 | 349 |

සමාලෝචිත වර්ෂය තුළදී නව ශාඛා නවයක් විවෘත කර තිබූ අතර, තැපැල් කාර්යාල 5 ක් ශාඛා බවට පරිවර්තනය කරන ලදී. බැංකු මෙහෙයුම් කටයුතුවල විශිෂ්ට ප්‍රගතියක් පෙන්නුම් කරමින් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම් හිමියන් සංඛ්‍යාව මිලියන 0.40 කින් වැඩි වී තිබූ අතර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ජාලය 221 සිට 231 දක්වා වැඩි වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වෙනත් වත්කම් -අරමුදල් සාවද්‍ය පරිහරණය සඳහාවූ අත්තිකාරම් ගිණුම**

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛා 22 ක සාවද්‍යාව පරිහරණය කර තිබූ අරමුදල් ප්‍රමාණය රු.13,963,717 ක් වූ අතර ඉන් සියයට 11 ක් වර්ෂ 5 කට වැඩි කාල පරිච්ඡේදවලට අදාළව විය. සාවද්‍යාව පරිහරණය කළ සමස්ත අරමුදලින් වර්ෂ 1 ඉක්මවූ මුළු මුදල් ප්‍රමාණය සියයට 94 ක් විය. තවද, බැංකුවේ ශාඛා 05 ක මුදල් අයකැමි ඌනතාවය රු.1,625,141 ක් බව නිරීක්ෂණය විය.

ජාතික ඉතිරි කිරිමෙ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් රක්ෂණයෙන් හානි ලබා ගැනීම සඳහා වූ කොන්දේසිවලට පරිබාහිර වංචාවන් වූ අතර වෙනත් සාවද්‍ය පරිහරණයන්රු.5,700,258 ක් විය. මේ සඳහා හානි රක්ෂණ ගෙවීම රක්ෂක විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

**(ආ) මාතර ශාඛාව සඳහා ගොඩනැගිල්ලක් මිලයට ගැනීම**

මාතර ශාඛාව පවත්වාගෙන යාම සඳහා මාතර, ධර්මපාල මාවතේ ගොඩනැගිල්ලක් සහිත පර්චස් 33.44 ක ප්‍රමාණයක ඉඩමක් රු. මිලියන 120 කට මිලදී ගෙන තිබුණි. 2012 දෙසැම්බර් 31 දක්වා මෙය ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර, මෙය නිෂ්කාර්ය වත්කමක් ලෙස නිරීක්ෂණය විය.

2009 නොවැම්බර් 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, මාතර තැපැල් ශාඛාව එම ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යාමට තීරණය කර තිබුණි. එහෙත් මේ සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි. තැපැල් ශාඛාව මෙහි ස්ථාපනය කිරීමට කටයුතු කරනු ලැබුවේ නම්, තැපැල් ශාඛාව සඳහා 2011 අගෝස්තු 30 සිට 2012 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද රු. 1,740,000 ක කුලී මුදල ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ඉතිරි කර ගත හැකිව තිබුණි.

**(ඇ) ශාඛා ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ඉඩම් මිලයට ගැනීම**

බම්බලපිටිය, මීගමුව හා පානදුර ශාඛාවල සැලසුම් වැඩ සඳහා 2008 හා 2009 වර්ෂවලදී රු.161,115,000 ක් වැය කර තිබුණද, 2012 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණි. ඉඩම් මිලදී ගත් වහාම ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් කර නොතිබූ හෙයින් ඉදිකිරීම් වැඩ සැලසුම් අදියරේ පවතින බව නිරීක්ෂණය විය.

**(ඈ) තැපැල් කාර්යාල මගින් බැංකුවේ ගනුදෙනු කිරීම සඳහා තැපැල්පතිවරයාට සේවා ගාස්තු ගෙවීම**

සේවා ගාස්තු ගෙවීම සඳහා ක්‍රමයක් බැංකුව විසින් හඳුනාගෙන ක්‍රියාත්මක කළේද යන්න හෝ තවදුරටත් තැන්පතු වටිනාකම වැඩි කර ගැනීම සඳහා තැපැල් කාර්යාලවල සේවක කාර්ය සාධනය වැඩි දියුණු කර ගැනීමට නව ක්‍රමයක් හඳුනාගත්තේද යන්න විගණනයේදී අනාවරණය නොවීය.

## 3.3 කොටස්වල ආයෝජන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොටසක් රු. 230 බැගින් සීමිත වගකීම් සමාගමක කොටස් 50,000 ක් විකිණීමට හිමිකම් කමිටුව විසින් 2011 සැප්තැම්බර් 07 දින අනුමැතිය ලබා දී තිබුණද කොටස් 45,500 ක් විකුණා නොතිබුණි.

(ආ) 2011 සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ සමාගම් 18 ක කොටස් 74,335,419 ක වටිනාකම හීනවීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව රු.642,188,028 ක ඇස්තමේන්තු ගත පාඩුවක් දරා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී කල් බදු මූල්‍ය සමාගමක කොටස් මිලදී ගැනීම් ප්‍රමාණය කොටස්142,500 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දින එහි වෙළඳපොළ වටිනාකම රු.4,861,188 ක් විය. කොටස්වල වටිනාකම හීනවීම රු.3,531,136 ක් වූ අතර එය මුළු කොටස් පිරිවැයෙන් සියයට 42.08 ක් නියෝජනය විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට මිල ප්‍රකාශිත සමාගම් 56 ක කොටස්වල සමස්ත ආයෝජන පිරිවැය රු. 8,453,508,446 ක් විය. මෙයින් සියයට 33.19 ක් නියෝජනය වන රු.2,806,064,502 ක මුදලක් දිගු කාලීන පදනම මත මිල ප්‍රකාශිත සමාගම් 3 ක ආයෝජනය කර තිබුණි. මිල ප්‍රකාශිත සමාගම් 56 න් 51 ක වෙළඳපොළ වටිනාකම 2012 වර්ෂය තුළදී රු.1,925,924,411 කින් හීන වී තිබූ අතර සමාගම් 5 ක පමණක් වෙළඳපොළ වටිනාකම රු.333,913,787 කින් වර්ධනය වී තිබුණි. ඒ අනුව, ආයෝජනය කරන ලද සමස්ත කොටස්වල වෙළඳපොළ වටිනාකම 2012 දෙසැම්බර් 31 දිනට රු.1,592,010,624 කින් හීන වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) 2011 වර්ෂයේදී වෙළඳපොළ වටිනාකම පිරිහී තිබුණු පුද්ගලික විවීම් නිෂ්පාදනාගාරයක (knitting mill) මිල ප්‍රකාශිත කොටස්වල 2012 වර්ෂයේදී කරන ලද ආයෝජන පිරිවැය රු.7,216,200 ක් විය. 2012 දෙසැම්බර් 31 දිනට මෙම සමාගමේ කොටස්වල මුළු ආයෝජන පිරිවැය රු.21,320,717 ක් විය. 2012 දෙසැම්බර් 31 දිනට වටිනාකමේ පිරිහීම රු.7,525,652 ක් විය.

(ඊ) 2012 වර්ෂයේදී පෞද්ගලික හිමිකම් භාර අරමුදලක රු.10,000,000 ක ආයෝජනයෙන් හා රු.13,760,593 ක්වූ වෙනත් පෞද්ගලික ඒකක භාර ආයෝජනයකින් කිසිදු ලාභයක් ලැබී නොතිබුණි. ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ස්ථාවර තැන්පතු සඳහා ගෙවන ලද පොලී සියයට 9 සිට සියයට 11.5 ක පරාසයක විය. එබැවින් ගනුදෙනුකරුවන්ට ගෙවන ලද වාර්ෂික පොලිය සැලකීමේදී, බැංකුව ඒකක භාර වලින් රු.1,823,106 ක්වූ ප්‍රතිලාභයක් අහිමි කර ගෙන තිබුණි.

තවද රු.50,000,000 ක්වූ වෙනත් ඒකක භාර ආයෝජනයකින් රු.3,961,965 ක ප්‍රතිලාභ ලබා ගෙන තිබූ අතර එයින් නියෝජනය වූ ආයෝජන මත ප්‍රතිලාභය සියයට 7.92 ක් විය. ස්ථාවර තැන්පතු සඳහා ගෙවන ලද වාර්ෂික පොලිය සැලකීමේදී ඒකක භාර ආයෝජනයෙන් ලද ප්‍රතිලාභය අඩු මට්ටමක විය.

(උ) ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 7.1.2(i) අනුව, සමාගමක ආයෝජන වටිනාකම සමස්ත ආයෝජන වටිනාකමින් (ආයෝජන කළඹ) සියයට 10 ක් නොඉක්මවිය යුතුය. කෙසේ වුවද, ආයෝජන වටිනාකම රු.1,301,844,864 ක් හා රු.1,058,577,120 ක් වූ සමාගම් 2 ක මෙම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 15.40 කින් හා සියයට 12.52 කින් වැඩි වී තිබුණි. එසේම ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 7.1.2 (iii) අනුව, ආර්ථික අංශයක ආයෝජන වටිනාකම සමස්ත ආයෝජන වටිනාකමින්

සියයට 30 ක් නොඉක්මවිය යුතුය. කෙසේ වුවද, 2012 දෙසැම්බර් 31 දිනට බැංකු හා මූල්‍ය අංශයේ එම සීමාව සියයට 38.8 ක් විය.

**3.4 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛාවක් ඉදිකිරිම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් 2009 ජනවාරි 29 දින මිලදී ගන්නා ලද වැතැම් වීදියේ ඉඩම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන තිබුණි. අත්පත් කර ගැනීම ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර, වන්දි ගෙවීම සඳහා පිරික්සීමක් 2012 ජුනි 28 දින සිදු කර තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන තක්සේරුව මත වන්දිය හා පොලිය පරීක්ෂණ දිනයේ සිට ගෙවන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර තිබුණි. එහෙත් විකුණුම්කාර සමාගමේ උකස්කරය නිරවුල් නොවී ඇති බවත් උකස්කරය නිරවුල් කිරීමෙන් පසුව තක්සේරුව සඳහා යොමු කරන බවත් ප්‍රාදේශීය ලේකම් දන්වා තිබුණි.

(ආ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා මහල් 18 ක ගොනැගිල්ලක් ඉදි කිරීමට 2008 සිට 2012 කාලපරිච්ඡේදය තුළදී රු.35,228,367 ක මුදලක් වැය කර තිබුණි. මෙය 2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. මෙම ඉඩම පිහිටි ප්‍රදේශය අධි ආරක්ෂිත කලාපයක් බව සැලකීමෙන් තොරව මෙම වියදම දරා තිබුණි. ගොඩනැගිල්ල නැවත ඉදි කිරීම හා දැනටමත් දරා ඇති වියදම පිළිබඳව 2012 දෙසැම්බර් 31 දිනට පවතින තත්ත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණු අතර, එය විගණනයේදී ඵල රහිත වියදමක් ලෙස හඳුනා ගන්නා ලදී.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත | කොන්ත්‍රාත් පදනම |
|---|---|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 737 | 583 | 160 | 6 | 4 |
| අධීක්ෂණ ශ්‍රේණි | 1,173 | 589 | 584 | - | - |
| මාණ්ඩලික නොවන ශ්‍රේණි | 1,649 | 1,421 | 264 | 36 | 475 |
| කණිෂ්ඨ සේවක | 163 | 54 | 109 | - | 3 |
| එකතුව | 3,722 | 2,647 | 1,117 | 42 | 482 |

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 3,722 ක් වූ අතර 2012 වර්ෂය තුලදී බැංකුව විසින් නිලධාරීන්/ සේවකයන් 2,647 ක් ස්ථිර පදනම මත හා නිලධාරීන් / සේවකයන් 482 ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 1,055 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 462 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම

2012 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ පහත දැක්වෙන ඉලක්කයන් බැංකුව විසින් ඉටු කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

| දර්ශකය | | ඉලක්කය | ඉටු කර ගැනීම | ඉටු කර නොගැනීම |
|---|---|---|---|---|
| (අ) | තැන්පතු වර්ධනය | 14% | 8% | 6% |
| (ආ) | වත්කම් වර්ධනය | 14% | 9% | 5% |
| (ඇ) | මුළු වත්කම් (රු.බිලියන) | 530 | 510 | 20 |
| (ඈ) | මුළු තැන්පතු (රු. බිලියන) | 485 | 458 | 27 |
| (ඉ) | පොලී ආදායමේ වර්ධනය | 16% | 12% | 4% |
| (ඊ) | වත්කම් මත ප්‍රතිලාභ (වාර) | 1.7 | 0.85 | 0.85 |
| (උ) | බදු පෙර ලාභය (රු.බිලියන) | 6.4 | 6.17 | 0.23 |
| (ඌ) | සේවකයෙකුට තැන්පතු (රු.මිලියන) | 161 | 146 | 15 |
| (එ) | සේවකයෙකුට ලාභය (රු.මිලියන) | 2.13 | 1.38 | 0.75 |

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් බැංකුවේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) ණය පරිපාලනය

(ඈ) ඉන්වෙන්ට්‍රි පාලනය

(ඉ) තොරතුරු රැස් කිරීම

(ඊ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම

(උ) වත්කම් කළමනාකරණය

(ඌ) ගනුදෙනුකරු ගිණුම් විවෘත කිරීම හා වසා දැමීම